**ශීර්ෂය 244 - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

----------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 244 - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත .මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 අග්‍රිම කළමනාකරණය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ අග්‍රිම අවශ්‍යතා ලේඛනය අනුව 2021 දෙසැම්බර් මාසය සඳහා රු.5,965,000 ක් අග්‍රිම ඇස්තමේන්තු කර තිබුණි. එම මාසයේ දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කළ අග්‍රිමය ඉක්මවා රු.10,848,000 ක අග්‍රිම ඉල්ලුම් කර තිබුණි. | 2021.10.01 දිනැති අංක 02/ 2021 (V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව නිලධාරීන් අවම දින ගණනක් සේවයට කැඳවීම හේතුවෙන් 2021 වර්ෂයේ මුල් කාර්තු තුළ ගෙවීම සඳහා ඉදිරිපත් වූ වවුචර් පත් සංඛ්‍යාව සීමා සහිත විය. එබැවින්, 2021 වර්ෂයේ අවසන් කාර්තුව තුළ නොවැම්බර් හා දෙසැම්බර් මාසයන්හි වැඩි වවුචර් පත් සංඛ්‍යාවක් ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත් වීම මත අග්‍රිම විචල්‍යතාවයක් පෙන්නුම් කළ ද එය අප දෙපාර්තමේන්තුව වෙත වෙන්කර තිබූ වාර්ෂික ප්‍රතිපාදන සීමා තුළ සිදු වී ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය අග්‍රිම භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කිරීමේදී නිවැරදි ඇස්තමේන්තු කිරීමක් කළ යුතු වීම. |

**2.2 වියදම් කළමනාකරණය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **ප්‍රතිපාදන නිෂ්ඵල වීම** | | |
| වැය විෂයන් 02 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.2,450,000 ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂයේදී කිසිදු උපයෝජනයක් නොකිරීම නිසා ශුද්ධ ප්‍රතිපාදනයම මුළුමනින්ම ඉතිරි කර තිබුණි. | 2021.08.30 දිනැති අංක අමප/21/1596/304/134 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දෙපාර්තමේන්තුව සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන ඉතිරි කිරීමට කටයුතු කිරීම, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නිලධාරීන් විදේශ ගමන් සඳහා සහභාගී නොවීම මත වැය විෂයයන්වල සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණයම ඉතිරි විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

(ආ) **අධි ප්‍රතිපාදන සලසා ගැනීම**

| | | |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයන් **09** ක් හා මූලධන වැය විෂයයන් දෙකක් සඳහා එකතුව රු.56,402,500 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු එකතුව රු.13,564,321 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | ආදායම් සංරක්ෂණ ආඥා පනත සැලසුම් කළ පරිදි මුද්‍රණය නොවීම, 2021.08.30 දිනැති අංක අමප/21/1596/304/134 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රතිපාදන ඉතිරි කිරීම, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රාජකාරී ගමන් සීමා වීම, යන්ත්‍රෝපකරණ භාවිතය අවම වීම, නිලධාරීන් අවම වශයෙන් අතිකාල සේවයේ යෙදීම, අපේක්ෂිත පරිදි රියදුරු පුරප්පාඩු සම්පූර්ණ නොවීම, අධ්‍යක්ෂ පුරප්පාඩු සම්පූර්ණ නොවීම නිසා ප්‍රවාහන දීමනා ඉතිරිවීම, ප්‍රායෝගික පුහුණු වැඩසටහන් නොපැවැත්වීම හා දේපළ ණය ලබා ගත් නිලධාරීන් ස්ථාන මාරු ලැබීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

(ඇ) **භෞතික වත්කම් අත්පත් කර ගැනීම**

| | | |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්ගේ මුදල් වැය කිරීම් ලෙස භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු.2,413,494 ක වටිනාකමක් දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය සඳහා එම වටිනාකම රු.2,403,494 ක් වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රමාණය රු.10,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | හැකියා වර්ධනය (capacity Building) සඳහා අයවැය ප්‍රතිපාදන 2401 වැය විෂය යටතේ ලබාදෙනු ලබයි. ඒ අනුව මෙය පුනරාවර්තන ස්වරූපයේ නොවන ප්‍රාග්ධන වියදමක් වේ. ඒ අනුව මානව සම්පත් ආයෝජනයේ කරනු ලබන වියදම් 2401 වැය විෂය යටතේ ගිණුම්ගත කර ආයෝජන ක්‍රියාකාරකම් මත වැය කරන ලද වියදමක් වශයෙන් පෙන්නුම් කරනු ලැබේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ හෝ මූල්‍ය කාර්යසාධන ප්‍රකශයේ හෝ සඳහන් වන භෞතික වත්කම් අත්පත් කර ගැනීම් යටතේ වන වියදම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් යටතේ ද ඇතුළත් කළ යුතු වීම. |

**2.3 නීති, රිති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) මුදල් රෙගුලාසි 1646 | දෙපාර්තමේන්තුව සතු සංචිත වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරංශ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණ සමඟ එකඟ වන අතර 2022 වර්ෂයේ සිට මාසික සාරාංශයේ මුල් පිටපත සමඟ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත එවීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම |
| (ආ) මුදල් රෙගුලාසි 104 (1) | 2021 සැප්තැම්බර් 03 දින දෙපාර්තමේන්තුව සතු කැබ් රථයකට සිදු වූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ.104(3) ප්‍රාරම්භක වාර්තාව යවන ලදී. එයට අමතරව 2021.12.03 දිනට ප්‍රථම අවසාන වාර්තාව අවසන් කිරීමට නොහැකි විය. රට තුළ පැවති අනතුරුදායක තත්ත්වය මත හා විෂය ලිපිකරුවන් අසනීප වීම හේතුවෙන් මෙම පරීක්ෂණ වාර්තා ප්‍රමාද වුවද, මේ වන විට අවසන් වාර්තාව සකස් කර ලේකම් තුමා වෙත යැවීමට කටයුතු සලසා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |
| (ඇ) මුදල් රෙගුලාසි 110, 1645(අ), හා 1647(ඉ) | සමාලෝචිත වර්ෂයේදී වාහන ලොග් පොත්, අලාභහානි ලේඛනය සහ වාහන ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | පරිපාලන නිලධාරියකු නොමැති හෙයින් හා විෂය ලිපිකරු කොරෝනා රෝගයෙන් ද , හානි පාඩු ලේඛනය සකසන නිලධාරිනිය ඩෙංගු රෝගයෙන්ද පෙළුණ හෙයින් ලොග් සටහන් පරීක්ෂා කිරීම හා හානි පාඩු ලේඛනයේ සටහන් තැබීමට නොහැකි විය. මෙම අඩුපාඩු නිවැරදි කර දැනට අදාළ කටයුතු නියමිත පරිදි සිදු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පොත්පත් සහ ලේඛන ක්‍රමවත් හා විධිමත් ලෙස පවත්වා ගතයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශය | වාර්තා කිරීමේ පදනම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඔබ විසින් නිරීක්ෂණය කළ පරිදි මූල්‍ය ප්‍රකාශය සමඟ ඉදිරිපත් කළ යුතු "වාර්තා කිරීමේ පදනම" 2021 වර්ෂයේ හෙළිදරව් කර නොතිබුණු අතර 2022 වර්ෂයේ සිට අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 7.6 ඡේදය | මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA – C) මුදල් හා හරස් සටහන් යන දෙඅංශයම සැලකිල්ලට ගෙන සෘජු ක්‍රමය භාවිතා කරමින් පිළියෙල කළ යුතුව තිබුණි. දෙපාර්තමේන්තුවේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදලින් ලද අත්තිකාරම් ලැබීම් හා මුදලින් කළ අත්තිකාරම් ගෙවීම් පමණක් සැලකිල්ලට ගෙන තිබුණි. ඒ අනුව ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ගෙවීම් රු.4,745,908 ක් ද අත්තිකාරම් ලැබීම් රු.4,474,982 ක් වී තිබුණි. නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පිළිවෙලින් රු.3,025,214 ක් හා රු.2,754,288 ක් වී තිබුණි. ඒ අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම්වල වටිනාකම රු.1,720,694 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී මේ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව ලබාදෙන උපදෙස් අනුව අවශ්‍ය සංශෝධන ඇතුළත් කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.1 ඡේදය | 2021 වර්ෂයේ සේවක මණ්ඩල පුහුණු කිරීම් වෙනුවෙන් රු.700,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණද, දෙපාර්තමේන්තුවේ 48 දෙනෙකුගෙන් යුත් සේවක සංඛ්‍යාවෙන් වර්ෂය තුළ පුහුණු අවස්ථා එක් නිලධාරියෙකු වෙත පමණක් ලබා දී තිබුණි. | 2021.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දෙපාර්තමේන්තුව සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන ඉතිරි කිරීමට සිදුවීම හා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් බැහැරගත පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය | දෙපාර්තමේන්තුවේ ස්ථානමාරු වීම් ලබා ගිය එක් නිලධාරියකුගේ හා ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 03 දෙනෙකුගේ එකතුව රු.797,731 ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් එම දෙපාර්තමේන්තු නිලධාරීන් සම්බන්ධ කර ගැනීම ගැටළුකාරී වූ අතර සාමාන්‍ය පරිදි රාජකාරී කිරීමට ඇතිවුන බාධා හේතුවෙන් ණය නිරවුල් කිරීමේ යම් කාලපමාවක් සිදුව ඇති හෙයින් ඔබ නිරීක්ෂණ සමඟ එකඟවෙමි.<br><br>එම හේතුවෙන් අයවැය චක්‍රලේඛ 118 හි 1.1.6 වගන්තිය අනුව කටයුතු කළ නොහැකි විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම, ආයෝජන හා රේගු සහයෝගීතාවය වැනි අනෙකුත් වෙළඳ අංශයන්ද ආවරණය වන පරිදි යෝජනා කරන ලද පහත සඳහන් බහු ආංශික වෙළඳ ගිවිසුම් 04 ක් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සාකච්ඡා මට්ටමේ පැවතිණි. එම ගිවිසුම් අත්සන් කර මූල්‍යමය හෝ භෞතික ප්‍රගතියක් ලඟා කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුපාර්ශ්වීය ගිවිසුමට අදාළ (BIMSTEC) සාමාජික රටවල ස්වේච්ඡා දායකත්වයෙන් බිම්ස්ටෙක් සංවර්ධන අරමුදල (BDF) පිහිටුවීමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා සහ පර්යේෂණ සහ සැලසුම් සඳහා උපයෝගී කර ගැනීම සඳහා බිම්ස්ටෙක් සංවර්ධන අරමුදල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කෙටුම්පත් සංකල්ප පත්‍රිකාව පිළිබඳ මෙම දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ/අදහස් මේ වනවිට විදේශ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | ප්‍රමාදයකින් තොරව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතු වීම. |

| | |
|---|---|
| (i) බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුපාර්ශ්වීය ගිවිසුම (BIMSTEC)<br>(ii) ආර්ථික සහ තාක්ෂණ සහයෝගීතා ගිවිසුම (ETCA) | ඉන්දියා- ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුම යටතේ සාමාන්‍ය ප්‍රතිපාදන සහ භාණ්ඩ වෙළඳාම පිළිබඳ 11 වන සාකච්ඡා වටය 2018 ඔක්තෝබර් මාසයේදී පවත්වා ඇත. |
| (iii) යෝජිත චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) | යෝජිත චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධ ඉදිරි කටයුතු සමාලෝචනය කරමින් පවතී. |
| (iv) ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA) | යෝජිත ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමේ ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන වාර්තා මේ වන විට අධ්‍යයනය කර ඇත. ඒ සම්බන්ධයෙන් වන ඉදිරි කටයුතු සිදු කිරීම සමාලෝචනයකින් අනතුරුව සිදු කළ යුතුව ඇත.<br><br>එසේම ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් වලට අදාළ කටයුතු සඳහා විශේෂ මූල්‍ය වැයවීමක් සිදු නොවන බැවින් ඊට අදාළ වන මූල්‍ය ප්‍රගතිය සඳහන් කිරීමේ හැකියාවක් නැත. මෙම වෙළඳ ගිවිසුම්වලට අදාල භෞතික ප්‍රගතියද රඳා පවතිනුයේ සාමාජික රටවල් විසින් බහුපාර්ශවීය ලෙස එකඟ වන කරුණු මතය.<br><br>සාමාජික රටවල් වලින් කරුණු විමසන අවස්ථා වලදී ඒ සඳහා අවශ්‍ය තොරතුරු හා සහභාගීත්වය මෙම දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අනුව රේගු ආඥා පනතේ 19(අ) වගන්තිවල සඳහන් විධිවිධානයන්ට හා රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව තීරුබදු කපා හැරීම්, අත් හැරීම් හා තීරුබදු සහන ලබාදීම් වලට අදාළ කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කළ යුතුව තිබුණි. එම කටයුතුවලට අදාළ 2019 වර්ෂයේ ප්‍රසිද්ධ කළ ගැසට් පත්‍රයේ නිවේදනයේ ඇතුළත් රෙගුලාසි සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 ජනවාරි 01 දින සිට 2021.12.31 දින දක්වා රේගු ආඥාපනතේ 19(අ) වගන්තිය යටතේ කපාහල තීරුබදු පිළිබඳ තොරතුරු 2022.03.31 දිනැති අංක 2273/74 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. | සැලසුම්වලට අනුකූලව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුවීම. |

**3.2 කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි කාර්යසාධන වාර්තා ඇතුළත් කර යාවත්කාලීන කළ යුතු වුවද, 2022 අප්‍රේල් 29 දින වන විටත් 2020 වර්ෂයේ කාර්යසාධන වාර්තා වෙබ් අඩවියෙහි ප්‍රදර්ශනය කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගතය පැවැති කාලසීමාව තුළදී නිලධාරීන් නිවසේ සිට රාජකාරී කටයුතු ඉටු කිරීම නිසා 2020 කාර්යසාධන වාර්තාව වෙබ් අඩවියට ඇතුළත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කර ගැනීමට නොහැකි වූ බැවින් එම කාර්යය අතපසු වූ අතර එම වරද නිවැරදි කර ගැනීමටත් ඉදිරියේදී අතපසුවීම් වලක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. | වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 64 ක් වූ අතර ඉන් තනතුරු 16 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තනතුරු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක්ද විය. | පුරප්පාඩු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවතී. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමටත්, එසේ නොවන තනතුරු තිබේ නම් ඒවා අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |